සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට (සාමාන්‍ය සේවක සංඛ්‍යාවට)
බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012 (2013)
(II වැනි කොටස) 2014

## (04) වාක්‍ය රචනය

පැ. තුනයි

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වන අතර එම එක් එක් කොටස යටතේ විස්තර හතරක් බැගින් දී ඇත.
- ඒවා අතුරින් **එක් කොටසකින් එක් විස්තරයක් බැගින්** තෝරා, එය පදනම් කොට ගෙන වචන **350** ක් පමණ ඇතුළත් වන පෙළ විශ්ලේෂණාත්මක වාක්‍ය රචනා **තුනක්** ලියන්න.
- අදාළ කොටස සමඟ අංකය ද ලියා **උචිත මාතෘකාවක්** ද යොදන්න. (උදා : II කොටස, ප්‍රශ්න අංක 6)
- ප්‍රශ්න **තුනකට** පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

1. ශ්‍රී ලාංකේය ජනවර්ග අතර සුහදතාව, සහජීවනය හා අන්‍යෝන්‍යාවබෝධය පවත්වා ගෙනයාම සඳහා තැබූ වැදගත් පියවරක් වශයෙන් ත්‍රිභාෂා සංකල්පය හඳුන්වා දිය හැකිය. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රය ගැන ප්‍රවීණත්වය ලැබූ පිරිසක් අනාගතයේ දී මෙරට බිහි වනවා පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් අප්‍රමාණ ප්‍රතිලාභ ලබා ගැනීමට ද මෙමගින් අවස්ථාව උදා වේ.

2. ඉංග්‍රීසිය ව්‍යක්තව හැසිරවීමට සමත් පුද්ගලයා සමාජයේ බහුමානයට පාත්‍ර වේ. ලෝකය දෙස එබී බලන කවුළුව ඉංග්‍රීසි දැනුමයි. මේ භාෂාව ඉගැන්වීම සඳහා ද මෙරට විවිධ ක්‍රමෝපාය අනුගමනය කෙරේ. එහෙත් මේවායේ යෝග්‍යතාව හා සාධනීයත්වය ගැන මතභේද පවතී. බොහෝ දෙනාගේ මතය වන්නේ ඉංග්‍රීසි ඉගැන්වීම හුදෙක් ධනෝපායන මාර්ගයක් බවට පෙරළී ඇති බවයි.

3. ප්‍රාථමික අධ්‍යාපනය උදෙසා වඩාත් යෝග්‍ය මාධ්‍යය වන්නේ දරුවන්ගේ මව්බස බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. අර්ථාවබෝධය හා අදහස් ප්‍රකාශනය වඩාත් පහසුවෙන් කළ හැකි වන්නේ මව්බසිනි. දරුවන් ඇසුරු කරන සමාජයෙහි භාවිත වන්නේත් මව්බසයි. එසේම වෙනත් ආගන්තුක භාෂාවකට වඩා මව්බසින් උගන්නා දේ ඉක්මනින් දරුවා අවබෝධ කර ගනී.

4. කවර රටක වුව ද සාහිත්‍යය සැලකෙන්නේ ජනතා උරුමයක් ලෙසිනි. සාමාජීය, සංස්කෘතික හා දේශපාලනික තොරතුරු ද සාහිත්‍යය මගින් ඉදිරිපත් කෙරේ. සමාජය යහමගට යොමු කිරීමට ද සාහිත්‍යය සමත් වෙයි. මේ අනුව සමාජයේ සිතුම් පැතුම් හා චර්යාවන් නිරූපණය කෙරෙන කැඩපතක් වශයෙන් ද ජනතාව දැනුවත් කරන තක්සලාවක් වශයෙන් ද සාහිත්‍යය හඳුන්වා දිය හැකිය.

(ලකුණු 33 යි)

### II කොටස

5. බෝ වන හා බෝ නොවන රෝගාබාධ නිසා ඇති වන වැළැක්විය හැකි මරණ සංඛ්‍යාව අඩු කිරීමෙන් මිනිසුන්ගේ ආයු අපේක්ෂාව තවදුරටත් වැඩි කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම රටක සෞඛ්‍ය ප්‍රතිපත්තිය මගින් ඉටු විය යුතු වැදගත් අංශයක් වේ. ශ්‍රී ලංකාවේ නගරබදව හා ගම්බදව ජීවත් වන විවිධ ජන කොටස්වල ජීවන තත්ත්වයන්ට අනුරූපීව සෞඛ්‍ය පහසුකම් සැලසීම රජයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද වගකීමකි.

6. ශ්‍රී ලංකාව සැලකෙන්නේ කෘෂිකාර්මික රටක් වශයෙනි. පැරණියන් කෘෂිකර්මයේ දී යොදා ගත් ක්‍රමෝපාය, කෘෂි උපකරණ, පොහොර වර්ග හා දේශීය සිරිත් විරිත් සියල්ල ක්‍රමයෙන් අභාවයට යමින් පවතී. මෙකල බොහෝ විට ඒ සඳහා නව්‍ය නිෂ්පාදන යොදා ගැනෙන අතර නව මුහුණුවරක් යටතේ කෘෂිකර්මාන්තය ප්‍රතිව්‍යුහගතකරණයට හසු වෙමින් පවතී.

[ 2 වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK
EXAMMOOD.LK

7. ස්ත්‍රී දූෂණ හා ළමා අපචාර ගැන ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය මගින් නිතර දැනගන්නට ලැබේ. වරදකරුවන්ට දඬුවම් ද පමුණුවනු ලැබේ. එහෙත් යථෝක්ත අපචාරයන්හි අඩුවීමක් ද නොපෙනේ. මෙබඳු අවාසනාවන්ත ක්‍රියාදාමයන් අවම කර ශිෂ්ට සම්පන්න හා විනය ගරුක සමාජයක් බිහිකිරීම ගැන රජයේ මෙන්ම පොදු ජනතාවගේත් අවධානය යොමු විය යුතුය.

8. මැදපෙරදිග රටවල උද්ගතව පවත්නා බල අරගලයන්හි ප්‍රතිඵලයක් වශයෙන් වර්ජන, ගැටුම් හා ජීවිත හානි ඇති වෙමින් පවතී. එසේම අන්තර්ජාතික ලෝක බලවතුන්ගේ ඇඟිලි ගැසීම් නිසා එම රටවල සටන් වඩාත් උග්‍ර තත්ත්වයට හැරී ඇති අතර සාමකාමී සහජීවනය කවදා කෙසේ ඇති කළ හැකි ද යන්න බරපතළ ප්‍රශ්නයක් බවට පත් වී තිබේ.

(ලකුණු 34 යි)

## III කොටස

9. ජංගම දුරකථනය ඉතා විශිෂ්ට නිර්මාණයකි. ඥාතිමිත්‍රාදීන් සමඟ පිළිසඳරෙහි යෙදීම ඇතුළු අපේ විවිධ අවශ්‍යතාවන් නිසා ඇති වන දුෂ්කරතා හා ඛේදජනක සිදුවීම් ගැන ද අසන්නට ලැබේ. මේ අනුව සංවරශීලීව හා විනය ගරුකව ජංගම දුරකථන භාවිතය සඳහා අපේ අවධානය යොමු විය යුතුය.

10. පරිගණකය නූතන සමාජයට ලැබුණු උසස් දායාදයකි. එමගින් සමාජයට සැලසෙන යහපත ඉමහත් ය. එහෙත් කුඩා දරු-දැරියන් පරිගණක භාවිතයට යොමු කරවීම ඉතා පරිස්සමින් කළ යුතු කාර්යයකි. එසේ නැතිනම් ඔවුන් නොමගට යොමු විය හැකිය.

11. ශ්‍රී ලංකාවේ ඇතැම් රූපවාහිනී වැඩසටහන් මගින් කාන්තා ප්‍රතිබිම්බය කෙලෙසීමට ලක් වෙතැයි යන මතයක් පවතී. මෙයට සාධක වශයෙන් දැක්වෙන්නේ සාම්ප්‍රදායික සාරධර්මවලට නොගැළපෙන සේ කාන්තාවන් සිය අඟපසඟ නිරාවරණය කරමින් රංගනයන්හි යෙදීම හා ස්ත්‍රීත්වය හෑල්ලුවට ලක් කෙරෙන අයුරින් බොළඳ ප්‍රේම ජවනිකාවල පෙනී සිටීම වැනි කරුණු ය. මේ අනුව යථෝක්ත මතධාරීන්ගේ අදහස වන්නේ කාන්තා ප්‍රතිබිම්බයේ උත්කෘෂ්ටභාවය ආරක්ෂා වන අයුරින් රූපවාහිනී වැඩසටහන් සකස් විය යුතු බවයි.

12. ශ්‍රී ලාංකේය සිනමා ඉතිහාසයෙහි බෙහෙවින් දක්නට ලැබෙන්නේ වැඩිහිටියන්ගේ වින්දනය උදෙසා නිෂ්පාදිත චිත්‍රපටයි. එහෙත් මෑතදී ළමයින් උදෙසා ද චිත්‍රපට කිහිපයක් ම නිෂ්පාදනය කෙරිණ. මේ චිත්‍රපට නිසා වැඩිහිටියන්ට පවා තම ළමා ජීවිතයේ අත්දැකීම් දෙස එබී බැලීමේ අවස්ථාවක් උදා වෙයි. මෙබඳු චිත්‍රපට ළමා පරපුරේ අධ්‍යාපනය, සෞන්දර්යය හා රසවින්දනය අගය කරන කාගේත් ප්‍රශංසාවට භාජනය වනු නොඅනුමානය.

(ලකුණු 32 යි)

* * *

EXAMMOOD.LK
EXAMMOOD.LK